**සැ. යු. -** 2026.03.13 දින අංක 2,480 දරන රජයේ *ගැසට් පත්‍රයේ* VI කොටසේ මාර්ගගත ක්‍රමය (Online) මගින් පළ වූ කොළඹ දිස්ත්‍රික් ජූරි සභික නාමාවලිය අවලංගු කරන ලදී.
මෙම නිවැරදි ජූරි සභික නාමාවලිය 2026.05.08 දින 2,488 දරන රජයේ *ගැසට් පත්‍රයේ* VI කොටසේ පළ විය.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,489 - 2026 මැයි මස 15 සිකුරාදා - 2026.05.15**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| තනතුරු අ◌ැබෑර්තු ... ... | 776 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... | 790 |
| අතුරු ව්‍යවස්ථා ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... | — |
| දේපළ විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... | — |


**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට්* පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 ජූනි මස 05 දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 මැයි මස 22 දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

2026 අප්‍රේල් මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**ප්‍රසන්න ජයරත්න,**
රජයේ මුද්‍රණාලයාධිපති.

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


775 - B 082793 — (2026/05)
F 1 -

# තනතුරු - ඇබෑර්තු

## මහරගම නගර සභාව

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ මහරගම නගර සභාවේ දැනට පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීම් කිරීමට සුදුසුකම් සපුරාලන බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනයක රාජ්‍ය සේවයේ නියුක්ත වූවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### 01. ආදායම් පරීක්ෂක

( ගරු ආණ්ඩුකාරතුමාගේ අංක: 1/1/4/254 හා 2015.01.02 දිනැතිව අනුමත කර ඇති පහත තනතුරු සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය)

පුරප්පාඩු ගණන : 04

වැටුප් පරිමාණය : MN -01 (2025)

රු. 45,230 - 10x540-11x630 - 10x890-10x1190 – රු. 78,360/-

(රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි උපලේඛන අංක II අනුව 2026.01.01 දිනට ආරම්භක වැටුප රු.43,274/- වන අතර 2027.01.01 දිනට ආරම්භක වැටුප රු.45,230/-)
හතරවන වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩ ඉමකි.

**(02) බඳවා ගන්නා ක්‍රමය :**

2.1. බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

2..2 අධ්‍යාපන සුදුසුකම් : අ.පො.ස.(සා.පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සිංහල/දෙමළ භාෂාව ඇතුළුව සම්මාන 02ක් සහිතව විෂයයන් 06 ක් සමත් වී තිබීම (මින් විෂයයන් 05 ක් එකවර සමත් විය යුතුය.)

2.3. වෘත්තීය සුදුසුකම් : අදාළ නොවේ

2.4. පළපුරුද්ද : බස්නාහිර පළාත් පාලන ආයතනයක ප්‍රාථමික සේවා ගණයක වැටුප් ලබන සේවය ස්ථිර කර ඇති හා වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සපුරා ඇති සේවකයින් වියයුතු අතර, මෙම කාලය තුළ කිසිඳු විනය දඬුවමක් ලබා නොතිබිය යුතුය.

2.5. කායික සුදුසුකම් : තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

2.6. වෙනත් සුදුසුකම් :

(i). ශ්‍රී ලාංකික පුරවැසියකු වීම.

(ii). සෑම අයදුම්කරුවෙකු ම බස්නාහිර පළාතේ ඕනෑම දිස්ත්‍රික්කයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

(iii). අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03 ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවකු වීම.

(iv). යහපත් චරිතයකින් යුක්ත වීම.

(v). මෙම තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින් සම්පූර්ණ කර තිබීම.

2.7. වයස් සීමාව : දැනටමත් අදාළ පළාත් පාලන ආයතනයේ සේවයේ නියුතු සේවකයින්ගෙන් බඳවා ගන්නා බැවින් වයස් සීමාව අදාළ නොවේ

**(03)** **සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :**

(i) මෙම තනතුර ස්ථිර විශ්‍රාම වැටුප් සහිතය

(ii) වැන්දඹු අනත්දරු හා වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප් අරමුදල් සඳහා දායක විය යුතුය

. (ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට යටත් විය යුතු වේ.)

(iii) මෙම තනතුර වසර 03 ක පරිවාස කාලයකට යටත්වේ.

(iv) මෙයට අමතරව ආයතන සංග්‍රහය,මුදල් රෙගුලාසි,බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීති, බස්නාහිර පළාත් මූල්‍ය රීති, බස්නාහිර පළාතේ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල පනවනු ලබන නියමයන් සහ පත්වීම් බලධරයා මහරගම නගර සභාවේ ලේකම්වරයා විසින් කලින් කල පනවනු ලබන නියමයන්ට යටත් විය යුතුය.

**(04)** බඳවා ගැනීමේ ක්‍රමය : ලිඛිත විභාගය

| *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| සාමාන්‍ය දැනුම හා බුද්ධි පරීක්ෂණය | 100 | 40% |
| ක්ෂේත්‍රයට අදාළ දැනුම පරීක්ෂා කිරීම | 100 | 40% |

4.1. පවත්වන බලධරයා : පත්වීම් බලධරයා මහරගම නගර සභාවේ ලේකම්වරයා වේ.

4.2. විෂය නිර්දේශය:

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| සමාන්‍ය දැනුම හා බුද්ධි පරීක්ෂණය | මෙම ප්‍රශ්න පත්‍රය ආර්ථික, සාමාජීය, අධ්‍යාපන, විද්‍යාත්මක, සංස්කෘතික, දේශපාලනික මෙන්ම ක්‍රීඩා ක්ෂේත්‍රය අදාළ දේශීය විදේශීය වශයෙන් වැදගත් වන්නා වූ කාලීන සිද්ධි පිළිබඳව අපේක්ෂකයාගේ දැනුම මැනීම සඳහා සකස් කෙරෙන ප්‍රශ්නවලින් හා අපේක්ෂකයාගේ භාෂා හැකියාව, තාර්කික ශක්තිය හා ගණිතමය හැකියාව පරීක්ෂා කිරීම සඳහා සකස් වූවකි. |
| ක්ෂේත්‍රයට අදාළ දැනුම පරීක්ෂා කිරීම | • මහනගර සභා ආඥාපනත, නගර සභා ආඥාපනත හා ප්‍රාදේශීය සභා පනත මඟින් අදායම් එක් රැස් කිරීම පිළිබඳව පැවරී ඇති බලතල<br>• පළාත් පාලන ආයතනයක ඇති ආදායම් උත්පාදන ප්‍රභවයන්<br>• කර්මාන්ත බදු, ව්‍යාපාර බදු, බලපත්‍ර ගාස්තු පැනවීම හා එක් රැස් කිරීම,නොගෙවන අවස්ථාවකදී නීතිමය කටයුතු කිරීම<br>• වරිපනම් බදු, අක්කර බදු පැනවීම, දැන්වීම් නිකුත් කිරීම, අයි ගාස්තු පැනවීම, වට්ටම් ලබා දීම ආදිය පිළිබඳ මූලික දැනුම පරීක්ෂා කිරීම. |

4.3. වෘත්තීය පරීක්ෂණ : අදාළ නොවේ

4.4 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පවත්වනු ලැබේ

4.5 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ.

**05.** ආදහනාගාර ක්‍රියාකරු සහයක

පුරප්පාඩු ප්‍රමාණය : 03

වැටුප් පරිමාණය : PL – 01 (2025)
රු. 40,000 - 10x450-11x490 - 10x540 - 12x590 – රු. 61,880/-

(රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි උපලේඛන අංක II අනුව 2026.01.01 දිනට ආරම්භක වැටුප රු.38,863/- වන අතර 2027.01.01 දිනට ආරම්භක වැටුප රු.40,000/-) හතරවන වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩ ඉමකි.

**(06)** බඳවා ගන්නා ක්‍රමය:

6.1. බදවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

6.2. අධ්‍යාපන සුදුසුකම් : අ.පො.ස.(සා.පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සිංහල/ දෙමළ භාෂාව ඇතුළුව සම්මාන 02ක් සහිතව විෂයයන් 06 ක් සමත් වී තිබීම. (මින් විෂයන් 05 ක් එකවර සමත් විය යුතුය.)

6.3 වෘත්තීය සුදුසුකම් : අදාළ නොවේ

6.4. පළපුරුද්ද : අදාළ නොවේ

6.5. කායික සුදුසුකම් : තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

6.6. වෙනත් සුදුසුකම් :
(i). ශ්‍රී ලාංකික පුරවැසියකු වීම.
(ii). සෑම අයදුම්කරුවෙකුම බස්නාහිර පළාතේ ඕනෑම දිස්ත්‍රික්කයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
(iii). අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03 ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවකු වීම.
(iv). යහපත් චරිතයකින් යුක්ත වීම.
(v). මෙම තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින් සම්පූර්ණ කර තිබීම.

6.7. වයස් සීමාව : දැනටමත් අදාළ පළාත් පාලන ආයතනයේ සේවයේ නියුතු සේවකයින්ගෙන් බඳවා ගන්නා බැවින් වයස් සීමාව අදාළ නොවේ.

**(07).** සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි:

(i). මෙම තනතුරු ස්ථිර විශ්‍රාම වැටුප් සහිතය.

(ii). වැන්දඹු අනත්දරු හා වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප් අරමුදල් සඳහා දායක විය යුතුය.

(ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට යටත් විය යුතු වේ.)

(iii) මෙම තනතුර වසරක පරිවාස කාලයකට යටත්වේ.

(iv). මෙයට අමතරව ආයතන සංග්‍රහය,මුදල් රෙගුලාසි, බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීති, බස්නාහිර පළාත් මූල්‍ය රීති, බස්නාහිර පළාතේ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල පනවනු ලබන නියමයන් සහ පත්වීම් බලධරයා මහරගම නගර සභාවේ ලේකම්වරයා විසින් කලින් කල පනවනු ලබන නියමයන්ට යටත් විය යුතුය.

**(08).** බඳවා ගැනීමේ ක්‍රමය : මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී සිදු කෙරේ.

| *ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| බඳවා ගැනීමේදී අවශ්‍ය මූලික අධ්‍යාපන සුදුසුකම්වලට අමතර ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් | 20 | 50% |
| කාලීන සිදුවීම් පිළිබඳ අවබෝධය | 75 | |
| පෞරුෂත්වය | 05 | |

**(09) අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :**

(i) මේ නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක (අංක 01 සිට 13 දක්වා පළමු පිටුවේ ද , අංක 14 සිට ඉදිරියට දෙවන පිටුවේ ද වනසේ) අයදුම්පත් පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය.

(ii) අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කර 2026.06.15 දින හෝ එදිනට පෙර ලැබෙන සේ "ලේකම්,මහරගම නගර සභාව, මහරගම" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ලැබෙන සේ එවිය යුතුය.

(iii) අයදුම්පත් පළාත් පාලන ආයතනයේ ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය.

(iv) තැපෑලේදී නැතිවන හෝ වැරදි ලෙස ලිපිනය ලිවීමෙන් ආපසු හරවා යැවුනු අයදුම්පත් සම්බන්ධයෙන් වගකියනු නොලබන අතර නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් මෙම නිවේදනයේ සඳහන් ආකාරයට පටහැනි අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(v). අයදුම්පත්‍රය සමඟ පහත සඳහන් ලියවිලි ඡායා පිටපත් අමුණා එවිය යුතුය.කිසියම් අයදුම්කරුවෙකු සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබූ විට මේ සහතිකවල මුල් පිටපත ඉදිරිපත් කිරීමට සූදානම්ව සිටිය යුතුය.

- උප්පැන්න සහතිකය
- අ.පො.ස(සා/පෙළ) සහතිකය
- මැතක දී ලබා ගත් චරිත සහතික දෙකක් (මෙම සහතික අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට ඉහතින් වූ මාස හයකට නො අඩු කාලයක් තුළ ලබා ගත් එකක් විය යුතුය.
- ජාතික හැඳුනුම්පත්‍රයේ හෝ රියදුරු බලපත්‍රයේ දෙපැත්තේ ඡායා පිටපත
- ප්‍රාදේශීය ලේකම්වරයා විසින් අනු අත්සන් කළ තමන්ගේ ස්ථිර පදිංචිය ඇති කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කළ පදිංචිය පිළිබඳ සහතිකය ( මෙම සහතිකය අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට ඉහතින් වූ මාස හයකට නොඅඩු කාලයක් තුළ ලබා ගත් එකක් විය යුතුය)
- පත්වීම් ලිපිය
- සේවය ස්ථිර කිරීමේ ලිපිය
- පළපුරුද්ද පිළිබඳ සහතික ( බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනයක ස්ථිර වසර 5 සේවා කාලය සඳහා සේවා සහතිකය)

**(10) පුරප්පාඩු සඳහා තෝරා ගන්නා ක්‍රමය:**

(i) යහපත් චරිතයකින් සහ මනා ශාරීරික සෞඛ්‍යයෙන් යුක්ත විය යුතුය.

(ii) ඉහත පළමු වන ඡේදයේ දක්වා ඇති තනතුරට අදාළව ඊට පහළින් ඉල්ලා ඇති අවම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

(iii) අදාළ බඳවා ගැනීමේ පරිපාටිවල විධිවිධාන අනුව විධිමත් ලිඛිත පරීක්ෂණ හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණට යොමු කරනු ලබන අතර එහිදී ලබා ගන්නා ඉහළම ලකුණු අනුව සුදුස්සන් තෝරා ගනු ලැබේ.

(iv) කිසියම් අයදුම්කරුවෙකු ලිඛිත විභාගය සමත් වූ පමණ හෝ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කළ පමණින් ඒ අයදුම්කරු බඳවා ගැනීම සඳහා සුදුස්සෙකු ලෙස නොසැලකිය යුතුය.

(v). ඉහත සඳහන් තනතුර සඳහා ලිඛිත පරීක්ෂණයක් පැවැත්වේ. අයදුම්පත්‍රයේ හා ඇමුණා ඇති සහතික අනුව අවශ්‍ය අවම සුදුසුකම් සම්පූර්ණ කළ බවට සඳහන් වීඇති තැනැත්තන් ප්‍රථමයෙන් අදාළ පරිදි ලිඛිත පරීක්ෂණයට යොමු කරනු ඇත.

(vi). ලිඛිත පරීක්ෂණයෙන් ඉහළම ලකුණු ලබා ගෙන ඇති තැනැත්තන් සම්මුඛ පරීක්ෂණයකට යොමු කරනු ලබන අතර,එහිදී අයදුම්පත්‍රයේ හා අමුණා ඇති සහතිකවල මුල් පිටපත් පරීක්ෂා කරනු ලැබේ.සම්මුඛ පරීක්ෂණයේ දී සුදුසුකම් සම්පූර්ණ කළ බවට තහවුරු කර ගත් අපේක්ෂකයන් අතරින් පුරප්පාඩු ප්‍රමාණයට සමාන ප්‍රමාණයක් බඳවා ගනු ලැබේ.

(vii). කිසියම් අයදුම්කරුවන් දෙදෙනෙකු හෝ වැඩි දෙනෙකු සමාන ලකුණු සංඛ්‍යාවක් ලබා ඇති විට ඒ අතරින් බඳවා ගනු ලබන තැනැත්තා කවුරුන් ද යන්න පත්වීම් බලධරයා විසින් තීරණය කරනු ලබන ආකාරයට විය යුතුය.

(viii). මේ පුරප්පාඩු පිරවීම සම්බන්ධයෙන් පත්වීම් බලධරයාට හෝ වෙනත් කවර හෝ තැනැත්තෙකුට විශේෂයෙන් කිසියම් බලපෑමක් කිරීම අපේක්ෂකත්වය අවලංගු වීමක් සේ සලකනු ඇත.

(ix). අයදුම්පත් කැඳවීමෙන් අනතුරුව හෝ අයදුම්පත් කැඳවන අතරතුර හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීමට හෝ වෙනස් කිරීමට හෝ මේ නිවේදනය සංශෝධනය කිරීම හෝ වෙනස් කිරීම හෝ අවලංගු කිරීම පත්වීම් බලධාරයා විසින් කරනු ලැබිය හැකිය.

(x). මෙම බඳවා ගැනීම සම්බන්ධයෙන් විධිවිධාන සලසා නොමැති සියළු කරුණු පිළිබඳ අවසාන තීරණය පත්වීම් බලධරයා වන මහරගම නගර සභාවේ ලේකම්වරයා සතුය.

කේ. තරංගා ගම්ලත්,
ලේකම් *(වැ.බ.)*,
මහරගම නගර සභාව.

2026 මැයි මස 15 දින,
මහරගම නගර සභා කාර්යාලයේ දී.

කාර්යාලයේ ප්‍රයෝජන සඳහා.

**ආදර්ශ අයදුම් පත්‍රය**

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල .............................................**
**තනතුර සඳහා අයදුම් පත්‍රය**

01. මුලකුරු සමඟ නම ( ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

| | | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | | | |

02. මුලකුරුවලින් හැඳින්වෙන නම (සිංහලෙන්)

.......................................................................................................................................

.......................................................................................................................................

03. මුලකුරුවලින් හැඳින්වෙන නම ( ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

| | | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | | | |

04. i. .ස්ථිර ලිපිනය (සිංහලෙන්) :-
.....................................................................................................................................................................
.....................................................................................................................................................................

ii. ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :-

| | | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | | |

ii. තාවකාලික ලිපිනය (සිංහලෙන්) :-
.....................................................................................................................................................................
.....................................................................................................................................................................

05. උපන් දිනය:- අවුරුද්ද : [ ][ ][ ][ ] මාසය: [ ][ ] දිනය: [ ][ ]

06. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :- අවුරුදු : [ ][ ] මාස: [ ][ ] දින : [ ][ ]

07. ජාතික හැඳුනුම්පත් අංකය :- [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]
(උප්පැන්න සහතිකයේ සහතික කළ පිටපතත් ඇමිණිය යුතුය)

08. විවාහක/ අවිවාහක බව :- ..........................................

09. දුරකථන අංක:- පෞද්ගලික: .................................

10. බස්නාහිර පළාතේ ස්ථිර පදිංචි කාළ සීමාව :- .................................
(ග්‍රාම සේවා සහතිකය මගින් සනාථ කළ යුතුය)

11. අධ්‍යාපන සුදුදුකම්:-
.....................................................................................................................................................................
.....................................................................................................................................................................
(සුදුසුකම් සහතික කිරීමට අදාළ සහතිකවල පිටපත් ඇමිණිය යුතුය.)

12. පළපුරුද්ද : .......................................................................................................................................................

13. වෙනත් සුදුසුකම් (ක්‍රීඩා හා වෙනත්) :-
.....................................................................................................................................................................
.....................................................................................................................................................................
(සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා සහතික කළ ඡායා පිටපත් ඇමිණිය යුතුය.)

14. i. ඔබ කිසියම් සාපරාධී වරදක් සම්බන්ධයෙන් කෙදිනකදී හෝ උසාවියකදී වරදකරු වී තිබේද ? (ඔව්/නැත)

ii. ඔබගේ පිළිතුර ඔව් නම් වරදේ ස්වභාවය හා දඬුවම කුමක්ද?
.....................................................................................................................................................................
.....................................................................................................................................................................

ඉහතින් මා විසින් සඳහන් කරන ලද කරුණු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටින අතර, කිසියම් තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව මා පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල ............................... III වන ශ්‍රේණියේ තනතුරකට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා...............................III වන ශ්‍රේණියේ තනතුරකට නුසුදුස්සකු වන බවත්, පත් කිරීමෙන් පසු අනාවරණය වුවහොත් කිසිදු වන්දියකින් තොරව සේවයෙන් පහ කළ හැකි බවත් මා දනිමි.

දිනය :- ........................................ .....................................
අයදුම්කරුගේ අත්සන.

### දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ............................................... මයා/මිය/මෙනවිය දැනට .................................. කාර්යාලයේ/ ආයතනයේ.................................. දින සිට මේ දක්වා.......................................(තනතුර) වශයෙන් ස්ථිර/තාවකාලික/අනියම්/ (අනවශ්‍ය වචන කපා හරින්න.) තනතුරක සේවය කරන බවද, ඔහුගේ /ඇයගේ සේවය සතුටුදායක බවද, මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා ඇය/ඔහු තෝරාගනු ලැබුවහොත් ඔහු/ ඇය දැනට දරන තනතුරින් නිදහස් කරන බවද/නොකරන බවද ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බව සහතික කරමි.

................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන හා නිලමුද්‍රාව.

දිනය :......................................................
සහතික කරන නිලධාරියාගේ නම :.....................................................
තනතුර : .....................................................
ලිපිනය : .....................................................

05-118

---

## මහනුවර මහා නගර සභාව

### මහනුවර මහා නගර සභාව සඳහා ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත සිවිල් ඉංජිනේරු සේවය ලබාගැනීම

මහනුවර මහා නගර සභාවේ සේවා අවශ්‍යතාවය මත ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත සිවිල් ඉංජිනේරු සේවය ලබා ගැනීම සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ අනුව අයදුම්පත් බහාලන කවරයෙහි වම්පස ඉහල කෙළවරෙහි සපයන සේවාවේ නාමය සඳහන් කර **2026.05.29** දිනට ප්‍රථම නාගරික කොමසාරිස්, මහනුවර මහා නගර සභාව, මහනුවර යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

1. තනතුරු සංඛ්‍යාව : තනතුරු 02

2. වයස : සියලුම අයදුම්කරුවන් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

3. මාසික දීමනාව : මාසික දීමනාව රු. 124,950/-කි. (මාසයකට අවම දින 25ක් රාජකාරි කළ යුතුය)

4. අධ්‍යාපන සුදුසුකම් : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක වසර 04ක පූර්ණ කාලීන විද්‍යාවේදී ඉංජිනේරු උපාධිය (BSc – Civil Engineering) ලබා තිබීම

5. වෘත්තීය සුදුසුකම් : ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ (ECSL) ලියාපදිංචිව සිටීම.

   සහ

   ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය (IESL) ආශ්‍රිත සාමාජිකත්වය (Associate Membership) ලබා තිබීම.

6. තෝරා ගැනීමේ ක්‍රමය : අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයවළුන් අතරින් බඳවා ගැනීමට අවශ්‍ය මූලික සුදුසුකම් සහිත අයදුම්කරුවන් සියලු දෙනා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට යොමු කරනු ලබන අතර, අවශ්‍ය සියලුම සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව නිසි සුදුසුකම් සහිත අයදුම්කරුවන් තෝරාගෙන ඔවුන් ලබාගත් ලකුණු ප්‍රමුඛතාවය අනුව බඳවා ගනු ලැබේ.

   සේවාව සපයා ගැනීමට තෝරාගනු ලබන නිලධාරින් පහත කොන්දේසිවලට යටත්ව සේවයේ යොදවා ගැනීම සිදු කරනු ලැබේ.

1. දිනකට අවම පැය 08 ක කාලයක් (සාමාන්‍ය රාජකාරි වේලාව තුළ) සේවාව සැපයිය යුතුය.

2. පූර්ණ කාලීනව රාජකාරීන්හි නියැලිය යුතුය.

3. සේවයේ අවශ්‍යතාවය මත සෙනසුරාදා දිනයන්හි සේවයේ යෙදිය යුතු අතර සුවිශේෂී රාජකාරි සඳහා ඉරිදා හා රජයේ නිවාඩු දිනයන්හි සේවය සැපයීම සඳහා කැඳවනු ලැබිය හැක. එවන් අවස්ථාවන්හිදී උක්ත මාසික දීමනාවට යටත්ව සේවය සැපයීම සිදු කළ යුතු වේ.

4. සේවා සැපයීමට අදාළ අවු: 1 ක කාල සීමාවක් සඳහා සේවා ගිවිසුමකට ඇතුළත් විය යුතු අතර සේවා අවශ්‍යතාවය මත මෙම කාල සීමාව දීර්ඝ කරනු ලැබේ.

7. වෙනත් සුදුසුකම් :

- අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
- බඳවා ගැනීම සඳහා වන සියලු සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.
- කායික සුදුසුකම් : තනතුරේ රාජකාරි ඉටු කිරීමට සෑම අයුරකින්ම ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතුය.
- අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

*සටහන* :- මෙම සේවයේ යොදවා ගැනීම සඳහා වන අයදුම්පත් මහනුවර මහා නගර සභාවේ www.kandy.mc.gov.lk වෙබ් අඩවියෙන් බාගත කර ගත හැක. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවශ්‍ය සියලු සුදුසුකම් සපුරා තිබිය යුතු අතර සේවය ලබා ගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය මහනුවර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සතුවේ. අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර කාල සීමාවේදී හෝ මෙම බඳවාගැනීම ප්‍රමාද කිරීම, වෙනස් කිරීම, මෙම නිවේදනය අවලංගු කිරීම, මෙම නිවේදනය සංශෝධනය කිරීම සම්බන්ධ පූර්ණ අයිතිය මහනුවර මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා සතුය.

ඒ. එච්. එම්. ඉන්දිකා කුමාරි අබේසිංහ,
නාගරික කොමසාරිස්,
මහනුවර මහා නගර සභාව.

2026 මැයි මස 15 දින.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***මහනුවර මහා නගර සභාව සඳහා ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත සිවිල් ඉංජිනේරු සේවය ලබාගැනීම***

01. අයදුම්කරු අයත්වන පළාත් පාලන ආයතනය: ..............................................................................

02. (අ) මුලකුරු සමග නම (සිංහලෙන්) : ..............................................................................
(ආ) සම්පූර්ණ නම (සිංහලෙන්) : ..............................................................................
(ඇ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්): ..............................................................................

03. ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

04. උපන්දිනය :- වර්ෂය : .................... මාසය: .................... දිනය: ....................

05. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට (2025.05.29 දිනට) වයස: අවුරුදු ............ මාස.............. දින............

06. ස්ත්‍රී/පුරුෂ භාවය : ..........................................................................

07. විවාහක / අවිවාහක භාවය : ..........................................................................

08. ස්ථිර ලිපිනය : ..........................................................................

09. දුරකථන අංකය : ..........................................................................

10. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක්ද යන වග? : ..........................................................................

එසේ නම් පරම්පරාවෙන්ද? ලියාපදිංචියෙන්ද? යන බව : ..........................................................

11. අධ්‍යාපන සුදුසුකම් :

11. (I) අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගය :

වර්ෂය : ....................
විභාග අංකය : ....................

| අනු. අංකය | විෂයය | ලබා ඇති ශ්‍රේණිය |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |
| 05 | | |
| 06 | | |
| 07 | | |
| 08 | | |
| 09 | | |
| 10 | | |

11. (II) අ.පො.ස. (උසස් පෙළ) විභාගය :

වර්ෂය : ....................
විභාග අංකය : ....................

| අනු. අංකය | විෂයය | ලබා ඇති ශ්‍රේණිය |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |

11. උපාධි හා වෙනත් උසස් අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ තොරතුරු :
..........................................................................................................................................
..........................................................................................................................................

12. වෘත්තීය සුදුසුකම් / සාමාජිකත්වය හා සේවා පළපුරුද්ද :
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................

13. අයදුම්කරුගේ සහතිකය:

මා විසින් ඉහතින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. ඉහත තොරතුරු කිසිවක් අසත්‍ය බව මා මෙම තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා පත්කිරීම සඳහා නුසුදුස්සකු වන බවත්, තෝරා ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා වහාම සේවයෙන් පහ කිරීමට යටත්වන බවත් පැහැදිලිව දනිමි.

........................
අයදුම්කරුගේ අත්සන.

දිනය :........................

05- 234/1

## මහනුවර මහා නගර සභාව

### මහනුවර මහා නගර සභාව සඳහා ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත තාක්ෂණ නිලධාරි (සිවිල්) සේවය ලබාගැනීම

මහනුවර මහා නගර සභාවේ සේවා අවශ්‍යතාවය මත ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත තාක්ෂණ නිලධාරි (සිවිල්) සේවය ලබා ගැනීම සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ අනුව අයදුම්පත් බහාලන කවරයෙහි වම්පස ඉහල කෙළවරෙහි සපයනු ලබන සේවාවේ නාමය සඳහන් කර 2026.05.29 දිනට ප්‍රථම නාගරික කොමසාරිස්, මහනුවර මහා නගර සභාව, මහනුවර යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

1. තනතුරු සංඛ්‍යාව : තනතුරු 02

2. වයස : සියලුම අයදුම්කරුවන් අයදුම්පත් ඉදිරිපත් කරන දිනට වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

3. මාසික දීමනාව : මාසික දීමනාව රු. 70,050/-කි. (මාසයකට අවම දින 25ක් රාජකාරි කළ යුතුය)

4. අධ්‍යාපන සුදුසුකම් : ක්ෂේත්‍රයට අදාළ විෂයයන් දෙකක් සහිතව විද්‍යා /ගණිත / තාක්ෂණවේදය විෂය ධාරාවට අයත් විෂයයන් තුනකින් අ.පො.ස. (උ.පෙළ) විභාගය එකවර සමත්වීම

සහ

සිංහල / දෙමළ / ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම

5. වෘත්තීය සුදුසුකම් : මොරටුව විශ්වවිද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව සමඟ සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයට අදාළව වසර 5ක පළපුරුද්ද;

හෝ

ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව සමඟ සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයට අදාළව වසර 5ක පළපුරුද්ද;

හෝ

අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව සමඟ සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයට අදාළව වසර 5ක පළපුරුද්ද;

හෝ

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව සමඟ සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයට අදාළව වසර 5ක පළපුරුද්ද;

හෝ

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම සමඟ සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයට අදාළව වසර 10ක පළපුරුද්ද;

සහ

රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 06 මට්ටමේ සුදුසුකම් හෝ ජාතික වෘත්තීය කුසලතා (NVQ) 05 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

6. තෝරා ගැනීමේ ක්‍රමය : අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයවළුන් අතරින් බඳවා ගැනීමට අවශ්‍ය මූලික සුදුසුකම් සහිත අයදුම්කරුවන් සියලු දෙනා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට යොමු කරනු ලබන අතර, අවශ්‍ය සියලුම සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව නිසි සුදුසුකම් සහිත අයදුම්කරුවන් තෝරාගෙන ඔවුන් ලබාගත් ලකුණු ප්‍රමුඛතාවය අනුව බඳවා ගනු ලැබේ.

සේවාව සපයා ගැනීමට තෝරාගනු ලබන නිලධාරින් පහත කොන්දේසිවලට යටත්ව සේවයේ යොදවා ගැනීම සිදු කරනු ලැබේ.

1. දිනකට අවම පැය 08 ක කාලයක් (සාමාන්‍ය රාජකාරි වේලාව තුළ) සේවාව සැපයිය යුතුය.
2. පූර්ණ කාලීනව රාජකාරීන්හි නියැලිය යුතුය.
3. සේවයේ අවශ්‍යතාවය මත සෙනසුරාදා දිනයන්හි සේවයේ යෙදිය යුතු අතර සුවිශේෂී රාජකාරි සඳහා ඉරිදා හා රජයේ නිවාඩු දිනයන්හි සේවය සැපයීම සඳහා කැඳවනු ලැබිය හැක. එවන් අවස්ථාවන්හිදී උක්ත මාසික දීමනාවට යටත්ව සේවය සැපයීම සිදු කළ යුතු වේ.
4. සේවා සැපයීමට අදාළ අවු: 1 ක කාල සීමාවක් සඳහා සේවා ගිවිසුමකට ඇතුළත් විය යුතු අතර සේවා අවශ්‍යතාවය මත මෙම කාල සීමාව දීර්ඝ කරනු ලැබේ.

7. වෙනත් සුදුසුකම් :

- අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
- බඳවා ගැනීම සඳහා වන සියලු සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.
- කායික සුදුසුකම් : තනතුරේ රාජකාරි ඉටු කිරීමට සෑම අයුරකින්ම ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතුය.
- අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

*සටහන* **:-** මෙම සේවයේ යොදවා ගැනීම සඳහා වන අයදුම්පත් මහනුවර මහා නගර සභාවේ www.kandy.mc.gov.lk වෙබ් අඩවියෙන් බාගත කර ගත හැක. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවශ්‍ය සියලු සුදුසුකම් සපුරා තිබිය යුතු අතර සේවය ලබා ගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය මහනුවර මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා සතුවේ. අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර කාල සීමාවේදී හෝ මෙම බඳවාගැනීම ප්‍රමාද කිරීම, වෙනස් කිරීම, මෙම නිවේදනය අවලංගු කිරීම, මෙම නිවේදනය සංශෝධනය කිරීම සම්බන්ධ පූර්ණ අයිතිය මහනුවර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සතුය.

ඒ. එච්. එම්. ඉන්දිකා කුමාරි අබේසිංහ,
නාගරික කොමසාරිස්,
මහනුවර මහා නගර සභාව.

2026 මැයි මස 15 දින.

**ආදර්ශ අයදුම්පත්‍රය**

**මහනුවර මහා නගර සභාව සඳහා ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත**
**තාක්ෂණ නිලධාරි (සිවිල්) සේවය ලබාගැනීම**

01. අයදුම්කරු අයත්වන පළාත් පාලන ආයතනය: ................................................................................

02. (අ) මුලකුරු සමග නම (සිංහලෙන්) : ..............................................................................
(ආ) සම්පූර්ණ නම (සිංහලෙන්) : ..............................................................................
(ඇ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්): ......................................................................

03. ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

04. උපන්දිනය :- වර්ෂය : ....................මාසය: .................... දිනය: ....................

05. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට (2025.05.29 දිනට) වයස: අවුරුදු ....... මාස..... දින.......

06. ස්ත්‍රී/පුරුෂ භාවය : ...............................................................................

07. විවාහක / අවිවාහක භාවය : ...............................................................................

08. ස්ථිර ලිපිනය : ...............................................................................

09. දුරකථන අංකය : ...............................................................................

10. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක්ද යන වග? : ..................................................................................

එසේ නම් පරම්පරාවෙන්ද? ලියාපදිංචියෙන්ද? යන බව ............................................................

11. අධ්‍යාපන සුදුසුකම් :

11. (I) අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගය

වර්ෂය : ....................
විභාග අංකය : ....................

| අනු. අංකය | විෂයය | ලබා ඇති ශ්‍රේණිය |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |
| 05 | | |
| 06 | | |
| 07 | | |
| 08 | | |
| 09 | | |
| 10 | | |

11. (II) අ.පො.ස. (උසස් පෙළ) විභාගය

වර්ෂය : ....................
විභාග අංකය : ....................

| අනු. අංකය | විෂයය | ලබා ඇති ශ්‍රේණිය |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |

11. ඩිප්ලෝමා හෝ වෙනත් උසස් අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ තොරතුරු :
.......................................................................................................................................
.......................................................................................................................................

12. වෘත්තීය සුදුසුකම් හා සේවා පළපුරුද්ද :
.......................................................................................................................................
.......................................................................................................................................
.......................................................................................................................................
.......................................................................................................................................

13. අයදුම්කරුගේ සහතිකය:

මා විසින් ඉහතින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. ඉහත තොරතුරු කිසිවක් අසත්‍ය බව මා මෙම තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා පත්කිරීම සඳහා නුසුදුස්සකු වන බවත්, තෝරා ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා වහාම සේවයෙන් පහ කිරීමට යටත්වන බවත් පැහැදිලිව දනිමි.

........................
දිනය :........................ අයදුම්කරුගේ අත්සන.

05- 234/2

## මහනුවර මහා නගර සභාව

### මහනුවර මහා නගර සභාව සඳහා ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත ව්‍යාපෘති සහකාර සේවය ලබාගැනීම

මහනුවර මහා නගර සභාවේ සේවා අවශ්‍යතාවය මත ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත ව්‍යාපෘති සහකාර සේවය ලබා ගැනීම සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ අනුව අයදුම්පත් බහාලන කවරයෙහි වම්පස ඉහළ කෙළවරෙහි සපයනු ලබන සේවාවේ නාමය සඳහන් කර 2026.05.29 දිනට ප්‍රථම නාගරික කොමසාරිස්, මහනුවර මහා නගර සභාව, මහනුවර යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

1. තනතුරු සංඛ්‍යාව : තනතුරු 01
2. වයස : සියලුම අයදුම්කරුවන් අයදුම්පත් ඉදිරිපත් කරන දිනට වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.
3. මාසික දීමනාව : මාසික දීමනාව රු. 70,860./-කි. (මාසයකට අවම දින 25ක් රාජකාරි කළයුතුය)
4. අධ්‍යාපන සුදුසුකම් : රජයේ පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් සහිත වීම
5. වෘත්තීය සුදුසුකම් : ව්‍යාපෘතියක අවම වසරක පළපුරුද්ද ලබාතිබීම
6. විශේෂ සුදුසුකම් : මධ්‍යම පළාත තුළ ස්ථිර පදිංචිකරුවන් විය යුතුය
7. තෝරා ගැනීමේ ක්‍රමය : අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයවළුන් අතරින් බඳවා ගැනීමට අවශ්‍ය මූලික සුදුසුකම් සහිත අයදුම්කරුවන් සියලු දෙනා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට යොමු කරනු ලබන අතර, අවශ්‍ය සියලුම සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව නිසි සුදුසුකම් සහිත අයදුම්කරුවන් තෝරාගෙන ඔවුන් ලබාගත් ලකුණු ප්‍රමුඛතාවය අනුව බඳවා ගනු ලැබේ.

   සේවාව සපයා ගැනීමට තෝරාගනු ලබන නිලධාරින් පහත කොන්දේසිවලට යටත්ව සේවයේ යොදවා ගැනීම සිදු කරනු ලැබේ.

   1. දිනකට අවම පැය 08 ක කාලයක් (සාමාන්‍ය රාජකාරි වේලාව තුළ) සේවාව සැපයිය යුතුය.
   2. පූර්ණ කාලීනව රාජකාරින්හි නියැලිය යුතුය.
   3. සේවයේ අවශ්‍යතාවය මත සෙනසුරාදා දිනයන්හි සේවයේ යෙදිය යුතු අතර සුවිශේෂී රාජකාරි සඳහා ඉරිදා හා රජයේ නිවාඩු දිනයන්හි සේවය සැපයීම සඳහා කැඳවනු ලැබිය හැක. එවන් අවස්ථාවන්හි දී උක්ත මාසික දීමනාවට යටත්ව සේවය සැපයීම සිදු කළ යුතු වේ.
   4. සේවා සැපයීමට අදාළ අවු: 1 ක කාල සීමාවක් සඳහා සේවා ගිවිසුමකට ඇතුළත් විය යුතු අතර සේවා අවශ්‍යතාවය මත මෙම කාල සීමාව දීර්ඝ කරනු ලැබේ.

7. වෙනත් සුදුසුකම් :
   - අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
   - බඳවා ගැනීම සඳහා වන සියලු සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.
   - කායික සුදුසුකම් : තනතුරේ රාජකාරි ඉටු කිරීමට සෑම අයුරකින්ම ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතුය.
   - අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

**සටහන :-** මෙම සේවයේ යොදවා ගැනීම සඳහා වන අයදුම්පත් මහනුවර මහා නගර සභාවේ www.kandy.mc.gov.lk වෙබ් අඩවියෙන් බාගත කර ගත හැක. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවශ්‍ය සියලු සුදුසුකම් සපුරා තිබිය යුතු අතර සේවය ලබා ගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය මහනුවර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සතුවේ.

අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර කාල සීමාවේදී හෝ මෙම බඳවාගැනීම ප්‍රමාද කිරීම, වෙනස් කිරීම, මෙම නිවේදනය අවලංගු කිරීම, මෙම නිවේදනය සංශෝධනය කිරීම සම්බන්ධ පූර්ණ අයිතිය මහනුවර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සතුය.

ඒ. එච්. එම්. ඉන්දිකා කුමාරි අබේසිංහ,
නාගරික කොමසාරිස්,
මහනුවර මහා නගර සභාව.

2026 මැයි මස 15 දින.

**ආදර්ශ අයදුම්පත්‍රය**

**මහනුවර මහා නගර සභාව සඳහා ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත**
**ව්‍යාපෘති සහකාර සේවය ලබාගැනීම**

01. අයදුම්කරු අයත්වන පළාත් පාලන ආයතනය: ..............................................................................

02. (අ) මුලකුරු සමඟ නම (සිංහලෙන්) : ..............................................................................
(ආ) සම්පූර්ණ නම (සිංහලෙන්) : ..............................................................................
(ඇ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්): ..............................................................

03. ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

04. උපන්දිනය :- වර්ෂය : ....................මාසය: .................... දිනය: ....................

05. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට (2025.05.29 දිනට) වයස: අවුරුදු ....... මාස..... දින.......

06. ස්ත්‍රී/පුරුෂ භාවය : ..............................................................................

07. විවාහක / අවිවාහක භාවය : ..............................................................................

08. ස්ථිර ලිපිනය : ..............................................................................

09. දුරකථන අංකය : ..............................................................................

10. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක්ද යන වග? : ..............................................................................

එසේ නම් පරම්පරාවෙන්ද? ලියාපදිංචියෙන්ද? යන බව ..........................................................

11. අධ්‍යාපන සුදුසුකම් :

11. (I) අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගය

වර්ෂය : ....................
විභාග අංකය : ....................

| අනු. අංකය | විෂයය | ලබා ඇති ශ්‍රේණිය |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |
| 05 | | |
| 06 | | |
| 07 | | |
| 08 | | |
| 09 | | |
| 10 | | |

11. (II) අ.පො.ස. (උසස් පෙළ) විභාගය

වර්ෂය : ....................
විභාග අංකය : ....................

| අනු. අංකය | විෂයය | ලබා ඇති ශ්‍රේණිය |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |

11. උපාධි/ඩිප්ලෝමා පිළිබඳ තොරතුරු :
..........................................................................................................................................
..........................................................................................................................................

12. වෘත්තීය සුදුසුකම් හා සේවා පළපුරුද්ද :
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................

13. අයදුම්කරුගේ සහතිකය:

මා විසින් ඉහතින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. ඉහත තොරතුරු කිසිවක් අසත්‍ය බව මා මෙම තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා පත්කිරීම සඳහා නුසුදුස්සකු වන බවත්, තෝරා ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා වහාම සේවයෙන් පහකිරීමට යටත්වන බවත් පැහැදිලිව දනිමි.

........................
අයදුම්කරුගේ අත්සන.

දිනය :........................

05- 234/3

---

# පළාත් පාලන නිවේදන

## පල්ලේපොල ප්‍රාදේශීය සභාව

### 1893 අංක 09 දරන ගෝඝාතක ආඥාපනත යටතේ විරෝධතා කැඳවීම

පල්ලේපොල ප්‍රාදේශීය සභාව විසින් 2026 අප්‍රේල් මස 09 දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක 06:02 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාවට වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එස්. එන්. ඩී. බී. ඩී. ඩබ්. ඩබ්. ඩී. බී. කොස්වත්ත,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
පල්ලේපොල.

2026 අප්‍රේල් මස 30 දින,
පල්ලේපොල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1893 අංක 09 දරන ගෝඝාතක ආඥාපනතේ 03 වගන්තියේ විධිවිධාන වලින් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව පල්ලේපොල ප්‍රාදේශීය සභා බල ප්‍ර දේශය තුළ 2026 වර්ෂය සඳහා ගවමස් වෙළඳසැලක් පවත්වාගෙන යාම සඳහා පහත උපලේඛනයේ දක්වා ඇති අයවලුන් වෙනුවෙන් බලපත්‍ර ලබා දීම පිළිබඳ විරෝධතා කැඳවනු ලබන අතර, ඒ සඳහා පල්ලේපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි හා ජීවත් වන අයෙක් හෝ අයවලුන් විරුද්ධ වන්නේ නම් ඔහු/ඇය එසේ විරුද්ධ වන්නේ කුමන හේතුවක් පදනම් කරගෙනද යන්න පිළිබඳ විස්තර ලිඛිතව පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ වූ දා දින සිට දින 14 ක් ඇතුළත පල්ලේපොල ප්‍රාදේශීය සභාව වෙත ලිඛිතව පිටපත් දෙකකින් දන්වා එවිය යුතු බව ගෝඝාතක ආඥාපනතේ 2(ආ) වගන්තිය ප්‍රකාරව පල්ලේපොල ප්‍රාදේශීය සභාව තීරණය කරන්නීය.

***උපලේඛනය***

| *අනු. අංක* | *ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය* | *ගවමස් වෙළඳසැල පවත්වාගෙන යන ස්ථානය* | *මස් වර්ගය* |
|---|---|---|---|
| 01 | එම්. එස්. එම්. ඉම්තියාස්,<br>අලුත්ගම, මනන්වත්ත | අලුත්ගම, මනන්වත්ත | ගවමස් |

05-192

**පූජාපිටිය ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) අ උප වගන්තිය යටතේ විරෝධතා කැඳවීමේ දැන්වීමයි

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) අ උපවගන්ති ප්‍රකාර මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ පූජාපිටිය ප්‍රාදේශීය සභාව විසින් පහත සඳහන් උපලේඛනයේ ඇති මාවත පූජාපිටිය සතු මාවත් වශයෙන් ප්‍රකාශයට පත්කිරීම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 8.1 වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව, 2026 වර්ෂයේ මාර්තු මස 10 දින මහ සභාවේ තීරණ අංක ඉ 1:4 යටතේ පූජාපිටිය ප්‍රාදේශීය සභාව සතු මාවත් වශයෙන් ප්‍රකාශයට පත්කරන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ පිළිබඳව ප්‍රදේශයේ පොදු ජනතාව විසින් මෙම මාර්ගයට අදාළ ඉඩම්වල අයිතිකරුවන් ලෙස හිමිකම්පාන පාර්ශවයන් යම් විරුද්ධත්වයක් පළ කරන්නේ නම් මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට එක් මාසයක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම 1987 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම කාල සීමාව තුළ මෙම නිවේදනය පිළිබඳව යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුනහොත් උපලේඛනයේ සඳහන් මංමාවත් පූජාපිටිය ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා ප්‍රකාශයට පත්කරමි.

සංජීව එදිරිසිංහ,
සභාපති,
පූජාපිටිය ප්‍රාදේශීය සභාව,
පූජාපිටිය.

2026 අප්‍රේල් මස 24 දින,
පූජාපිටිය ප්‍රාදේශීය සභාව.


| | | |
|---|---|---|
| 01. මාර්ගයේ නම | : | අතාවුල්ලා මාවත |
| 02. ආරම්භය | : | බැබිලගොල්ල මහ පල්ලිය ප්‍රාදේශීය සභා මාර්ගය |
| 03. අවසානය | : | එම්. එම්. පරිදා බිම් නමැති අයගේ ඉඩම |
| 04. ග්‍රාම නිලධාරි වසම | : | ගල්හින්න (524) |
| 05. පිඹුරු අංකය | : | 14031 |

**මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා වම්පස සහ දකුණුපස**

| *වම්පස* | *දකුණුපස* | *මාර්ගයේ දිග* | *මාර්ගයේ පළල* |
|---|---|---|---|
| 01. එච්. හලීමා | 01. එල්. ටී. ඒ. මුත්තලිෆ් | මීටර් 66 | මීටර් 2.4 |
| 02. එම්. ඒ. එෆ්. අස්නා | 02. එම්. එම්. පරිදා බිබි | | |
| 03. එම්. එම්. පරිදා බිබි | | | |

PRIYANTHA PUNCHIHEWA
Licensed Surveyor & Leveller,
10-C, Main Street,
Pujapitiya
T.Phone : 0812300702

**PLAN NO:14031**




SCALE 1:500

## PLAN

OF

*An Allotment of land called*

*Portion of Keenagahamulawatta*

SITUATED AT

*Galhinna in Pallegampaha of Harispattu*

*(Galhinna G.N.Division No 524 of Pujapitiya Secretarial Division & Pradesiya Sabha)*

**KANDY DISTRICT**

**CENTRAL PROVINCE**

**Containing in Extent :**

| Lot No | Hectare | $m^2$ | A | R | P | Allotted to |
|---|---|---|---|---|---|---|
| 1 | 0.0158 | 158 | 0 | 0 | 06.25 | Pujapitiya Pradesiya Sabha(min.8Ft.wide Road) |

සත්‍ය පිටපතකි

Surveyed on :15-08-2020

F.B.No:294/34-35

පී.එච්.ජී. තරංගා හේමරත්න
ප්‍රධාන කළමණාකරණ සේවා නිලධාරි
පූජාපිටිය ප්‍රාදේශීය සභාව
පූජාපිටිය

Licensed Surveyor & Leveller

**අරණායක ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(3) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

1989 අංක 12 දරන (ආනුශාංගික විධිවිධාන පනතේ) දෙවන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) ආ වගන්තිය ප්‍රකාරව කටයුතු කරමින් 24(2)ආ වගන්තිය ප්‍රකාරව 2025 නොවැම්බර් මස 14 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ*IV(ආ) කොටසෙහි ප්‍රකාශයට පත් කරන ලද මෙම මාර්ගය අරණායක ප්‍රාදේශීය සභාව සතු මාර්ග ලෙස මෙයින් ප්‍රකාශයට පත්කරනු ලැබේ.

එම්. පී. මංජුල සෙනවිරත්න,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
අරණායක.

2026 අප්‍රේල් මස 29 දින,
අරණායක ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | : | පැහිණිබැද්දර බෝපිටිගොඩ මාර්ගය |
| මාර්ගයේ ආරම්භය | : | පැහිණිබැද්දර ගම්සභා මාර්ගය |
| මාර්ගයේ අවසානය | : | බෝපිටිගොඩ දක්වා |
| ග්‍රාම සේවා වසම හා අංකය | : | පැහිණිබැද්දර 45 සී |
| මාර්ගයේ දිග හා පළල | : | දුර - මීටර් 239, පළල - අඩි 08 |

**මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා දකුණුපස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම :**

| | *ඉඩම් අයිතිකරුගේ නම* | *ඉඩමේ නම* |
|---|---|---|
| 1. | එම්. පී. ජයසුමන අභයවීර මයා | ගලහිටියාවකුඹුර |
| 2. | ආර්. පී. සී. රාජපක්ෂ මයා | දෙලහිටියාව |
| 3. | ආර්. පී. කේ. රාජපක්ෂ මයා | බෝපිටිගොඩවත්ත |
| 4. | ඩබ්. විජේරත්න මයා | බෝපිටිගොඩවත්ත |
| 5. | ආර්. පී. තිලකරත්න මයා | බෝපිටිගොඩවත්ත |
| 6. | එච්. පී. සුනිල් වික්‍රමසිංහ මයා | බෝපිටිගොඩවත්ත |

**මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා වම්පස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම :**

| | *ඉඩම් අයිතිකරුගේ නම* | *ඉඩමේ නම* |
|---|---|---|
| 1. | එම්. පී. ලයනල් මයා | කොලපැලවත්ත |
| 2. | ආර්. පී. ජී. රාජපක්ෂ මයා | බෝපිටිගොඩවත්ත |
| 3. | ආර්. පී. සම්පත් කුමාරදාස මයා | බෝපිටිගොඩවත්ත |
| 4. | ආර්. පී. සමන්ත කුමාර මයා | බෝපිටිගොඩවත්ත |

බලයලත් මිනින්දෝරු එච්. එම්. ආර්. ටී. කේ. හේරත් මයාගේ 2025.05.25 මනින ලද පිඹුරුපත් අංක 1775 දරන පිඹුරුපත අනුව වේ.

මාර්ගයේ නම : උඩහවත්ත මාර්ගය
මාර්ගයේ ආරම්භය : බිම්කනටිය මාර්ගය
මාර්ගයේ අවසානය : උඩහවත්ත දක්වා
ග්‍රාම සේවා වසම හා අංකය : ගැටබේරිකන්ද
මාර්ගයේ දිග හා පළල : දුර - මීටර් 85, පළල - අඩි 08

**මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා දකුණුපස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම :**

| | *ඉඩම් අයිතිකරුගේ නම* | *ඉඩමේ නම* |
|---|---|---|
| 1. | එම්. පී. ප්‍රියානි බණ්ඩාර මිය | උඩහවත්ත |
| 2. | එච්. පී. රණසිංහ මයා | |
| 3. | ඒ. වී. සම්පත් මයා | |
| 4. | එම්. පී. ප්‍රියානි බණ්ඩාර මිය | උඩහවත්ත |
| 5. | එම්. පී. උපාලි සමරවීර | උඩහවත්ත |

**මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා වම්පස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම :**

| | *ඉඩම් අයිතිකරුගේ නම* | *ඉඩමේ නම* |
|---|---|---|
| 1. | කේ. ජී. යූ. ජී. වික්‍රමසිංහ මයා | කුරහන්කොටුව |
| 2. | ඒ. වී. අසංක රවින්ද්‍ර මයා | උඩහවත්ත |
| 3. | එම්. පී. ප්‍රියානි බණ්ඩාර මිය | උඩහවත්ත |
| 4. | ලීලාරත්න මයා | උඩහවත්ත |

බලයලත් මිනින්දෝරු එච්. එම්. ආර්. ටී. කේ. හේරත් මයාගේ 2025.05.25 මනින ලද පිඹුරුපත් අංක 1773 දරන පිඹුරුපත අනුව වේ.

මාර්ගයේ නම : තල්ගමුව කරහන්පිටිගොඩ මාලියද්දවත්ත මාර්ගය
මාර්ගයේ ආරම්භය : තල්ගමුව කරහන්පිටිගොඩ මාර්ගය
මාර්ගයේ අවසානය : කරහන්පිටිගොඩ පන්සල දක්වා
ග්‍රාම සේවා වසම හා අංකය : 35ඒ - තල්ගමුව
මාර්ගයේ දිග හා පළල : දුර - මීටර් 332, පළල - අඩි 09

**මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා දකුණුපස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම :**

| | *ඉඩම් අයිතිකරුගේ නම* | *ඉඩමේ නම* |
|---|---|---|
| 1. | වී. ටී. සිරිසේන මයා | කලවිමගේවත්ත |
| 2. | පී. ජී. ධර්මදාස මයා | මානන්නලාගේවත්ත |
| 3. | ලයිසා මිය | මානන්නලාගේ හිටිනාවත්ත |
| 4. | අබේකෝන් මයා | පොල්පිටියාවත්ත |
| 5. | බෙත්තාරාම පන්සල | පන්සල්වත්ත |

**මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා වම්පස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම :**

| | *ඉඩම් අයිතිකරුගේ නම* | *ඉඩමේ නම* |
|---|---|---|
| 1. | මහින්ද වර්ණකුලසූරිය මයා | ගලේකෙටුවවත්ත |
| 2. | ආරියරත්න මයා | ශිල්පවත්ත |
| 3. | කේ. ජී. එල්. රණසිංහ මයා | පන්සලේවත්ත |
| 4. | ලලිත් එස්. ආරියරත්න මයා | පන්සලේවත්ත |
| 5. | පී. එම්. කරුණාරසේන මයා | පල්ලේහගෙදරවත්ත |
| 6. | එම්.ජිනදාස මයා | පල්ලේහගෙදරවත්ත |
| 7. | කේ. ජී. ඒ. ජයවික්‍රම මයා | පල්ලේහගෙදරවත්ත |
| 8. | ආරියරත්න මයා | පල්ලේහගෙදරවත්ත |
| 9. | හේරත් මයා | |
| 10. | ඒ. ඩී. දීපිකා ප්‍රනාන්දු | මාලියද්දේවත්ත |

බලයලත් මිනින්දෝරු පී. ඉන්ද්‍රාණි මල්ලිකා මියගේ 2025.08.12 මනින ලද පිඹුරුපත් අංක 5505 දරන පිඹුරුපත අනුව වේ.

05-188

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.